# අපරාධයට යොමුවූ නව යොවුනන් කණ්ඩායමක් පිළිබඳ අධ්‍යයනයක්

(මාකොළ සහතික කළ පාසල ඇසුරින්)

ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා

ඉදිරිපත් කරනු ලබන නිබන්ධන කෘතිය

ර්. කේ. වික්‍රමරත්න

1983.10.10.

UCLIB
388304

## සා රා ං ශ ය

බාලාපචාර තත්වය අවබෝධ කර ගැන්මට ලෝකයේ විවිධ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේද පර්යේෂණ පවත්වා ඇත. ළමා අහිතකර චර්යා නිර්මාණය වන ආකාරය පිළිබඳව විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් බලමින්, විවිධ අවධාරණයන් සහිතව, විවිධ ප්‍රතිකර්මද ඒ අනුව ඉදිරිපත්ව තිබේ. කෙසේ වෙතත් ලෝකයේ බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේද ළමුන් හා යෞවනයින්ගේ සමාජ විරෝධී හැසිරීම් ස්වභාවයන් තවමත් සමාජ ප්‍රශ්නයක්ව පවතී.

ශ්‍රී ලංකාවේ බාලාපචාරය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම් වස් මාකොළ සහතික කළ පාසලේ නේවාසික අපචාරීන් පර්යේෂණයට ලක් කරමින් ලබා ගත් තොරතුරු ආශ්‍රිත නිබන්ධනයකි මේ.

පර්යේෂණයට භාජනය වූ අපචාරී කණ්ඩායමෙන් ඉතා විශාල පිරිසක් සොරකම හා සම්බන්ධ වැරදිවල නිරත වූවන් බව පැහැදිලි විය. දේපල සොරකම මුදල් සොරකම හා ගෙවල් බිඳීමද ඇතුලත් වැරදි සඳහා චෝදනා ලත් ප්‍රමාණය අධිකය. ගම්බද හා නාගරික අපචාරී තත්වයෙහි එතරම් කැපී පෙනෙන වෙනසක් නොපෙනුනි. මුලු පිරිසෙන් පහෙන් එකකට ආසන්න ප්‍රමාණයක් කිසි දිනෙක පාසල් ගොස් නැත. පාසල් හැර යාම හා නිකරුනේ කාලය ගත කිරීමද අපචාරයට මං පාදයි.

අපචාරීන් අපචාරයෙහි වැඩිපුරම යෙදෙන්නේ වයස අවු: 14 හා 15 යන වයස් වලදීය. අපචාරීන් බොහෝ දෙනෙක්ගේ අතීත පසුබිමද අපචාරයට තැඹුරු වූවකි.

බාලාපචාරීන් වැඩි දෙනෙක්ගේ නිවාස සතුටුදායක ස්වභාවයක් දරයි. කෙසේ වෙතත් ඔවුන්ගේ නිවෙස් තුළ ජනගහණය අධිකය. ඔවුන්ගේ පියවරුන්ට හා මව්වරුන්ට උසස් මට්ටමේ රැකියා ලැබී තිබෙන්නේ ස්වල්පයකි. දෙමාපියන් අතරද නූගත්කම පැතිර ඇත. සුළු පියා හා සුළු මවගේ ක්‍රියාකාරීත්වයද පවුලේ දරුවන්ගේ හැසිරීම අයහපත් තත්ත්වයකට පත් කිරීමෙහි ලා බලපෑමක් කරයි.

දෙමාපිය උණුසුම හා රැකවරණය නොලැබීමෙන්ද අපචාරී ජීවිතයට රුකුලක් ලැබෙන බවට සාධක ඉදිරිපත් විය. දෙමාපියන්ගේ හැසිරීම, පැවතුම් ආදිය දරුවන්ගේ හැසිරීම යහපත් හෝ අයහපත් තත්ත්වයකට පමුණුවාලීමට හේතු වෙයි. නිවසේදී පිළිගැනීමට ලක් නොවීම, නව අත්දැකීම් නොලැබීම වැනි ස්වභාවයන් අපචාරීන් කෙරෙහි දක්නට ඇත. දෙමාපිය - සහෝදර අපරාධකාරී පසුබිම, නිවසේ සාමාජිකයින්ගේ මත්පැන් ඇබ්බැහිකම් ආදිය අහිතකර බලපෑමක් ඇති කරවන්නේ යයි සැළකීමට තුඩු දෙන සාක්ෂි ඉදිරිපත් විය.

තම නිවසින් පිටව සිටි අය එසේ සිට ඇත්තේ නිවසෙන් පැන යාම, නෑදෑ ගෙදරක පදිංචිය හෝ රැකියාවකට යාම වැනි කරුණු නිසාය. මේ කුමන කරුණකින් වුවද දිස් වන්නේ ආර්ථික අඩුපාඩු නිසා පාසල් නොයා රැකියාවකට යාමට සිදුවීම, නිවස තුළ මානසික අයහපත් තත්ත්වය නිසා පැන යාම, සුළු පියා - සුළු මවගෙන් වන හිරිහැර පීඩා නිසා හෝ මවත් පියාත් දෙදෙනාම අහිමි නිසා නෑදෑ ගෙදරක නැවතී සිටීමට සිදුවීම වැනි ශෝචනීය තත්ත්වයකි.

යමෙක් පදිංචි නිවස අවට අයෝග්‍ය පරිසර තත්වය මෙන්ම අසල්වැසි අයහපත් සබඳතා නිසාද අපචාරයට රුකුල් ලැබේ.

නැවත නැවත එකම පංතියේ ඉගෙනුම ලැබීමට සිදුවීම හා ජාතියේ

වැඩ කරගෙන යාමට තරම් කියවීමේ හැකියාවක් නො මැති වීම පාසල් ගමන ප්‍රිය ජනක නොවීමට හේතුවේ. කට්ටි පැනීම බෙහෙවින් අපචාරීන් වෙත දක්නට ඇත. අපචාරීන් පාසල් යන කාලයේදී ගුරු සබඳතා ද අයහපත්ය. මොවුන්ගේ පාසල් හැර යාමට බොහෝ සෙයින් හේතු වන්නේ මිතුරන් සමඟ විනෝදයෙන් ඇවිදීමට යාම වීම විශේෂ කරුණකි.

යම් ශාරීරික ආබාධයක්, සුලු අසනීප ගතියක් අපචාරීන් බොහෝ දෙනෙකු වෙත දකිත හැකි ලක්ෂණයකි. තදබල රෝග හා අනතුරු වලට භාජනය වී තිබීමේ තත්වද අපචාරීන් අතර සෑහෙන තරම් බහුලය.

අපචාරීහු විවේක කාලය වැඩිපුරම ගෙදරින් පිටත ගත කිරීමට කැමැත්තක් දක්වති. චිත්‍රපටි බැලීම, මිතුරක් සමඟ විනෝද වීම, හා සූදු ක්‍රීඩාවද විවේක කෘලයේදී නිරත වන දේවල්ය. ස්ව අභිමතානුකූලව කටයුතු කිරීමද ඔවුන්ගේ ස්වභාවයයි. විවේක කාලයේදී යහපත් බලපෑම් ලබන්නේ ඉතා අඩුවෙනි.

අයහපත් හැසිරීම සහිත මිතුරන් ඇසුරු කිරීමද අපචාරීන්ගේ ස්වභාවයකි. අහිතකර හැසිරීම් සඳහා මිතුරු සහභාගීත්වය ද සුලභය.

නුපුහුණු රැකියාවන්හි යෙදී සිටීමට අපචාරීන්ට සිදුව ඇත්තේ ඔවුන් පූර්ව වෘත්තිය පුහුණුවක් නොලැබ රැකියාවන්හි නිරත වන නිසාය. මේ නිසා ඔවුහු තමන් කරන රැකියාවෙන් තෘප්තියක්ද නොලබති.

යහපත් චරිත වර්ධනයට අනුබල ලැබෙන දහම් පාසල් අධ්‍යාපනය ලැබීම හෝ සුචරිත වර්ධන සමිති සමාගම් ආදියට සම්බන්ධ වී සිටීම දක්නට ලැබෙන්නේ ප්‍රමාණවත් අයුරකින් නොවේ. චිත්‍රපටය අනියම් ආකාරයකින් අපචාරී ජීවිතයට අනුබල දෙන නමුත්, වෙනත් සංනිවේදන මාධ්‍ය හෝ පවුලේ උදවියගෙන් .

සෘජු අහිතකර බලපෑමක් නොලබති.

දුම්පානය, මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයද අපචාරීන් හා සම්බන්ධ වන අයුරු විද්‍යමාන විය. මත් පෙතිද භාවිතා කළ බවට සාධක ලැබිනි. පිතුරන් මගින් මෙම අහිතකර පුරුදු වලට ඇබ්බැහි වෙති.

සහතික කළ පාසල් ජීවිතයෙන් පසු මාපියන් වෙත යාමට වඩාත් කැමැත්තක් දක්වන නමුදු, සුලු මව – සුලු පියා සිටින්නේ නම් තම නිවසට යාමට නේවාසිකයින් දක්වන කැමැත්ත අඩුය. වැඩි දෙනෙක් අනාගතයේ කාර්මික වෘත්තියක යෙදෙන්නට කැමැත්තෝය.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් කෙරෙන ආයතනික පුනරුත්ථාපන ක්‍රමයේ චර්යාව හැඩ ගැස්වීම සම්බන්ධ අරමුණ ඉටුවන බව පෙනී යයි. එහෙත් ආයතනයෙන් ලබා දෙන වෘත්තීය පුහුණුවෙහි යම් යම් අඩුපාඩු තිබේ. තවද එම පුහුණුවෙන් පසු වෘත්තියක් නොලැබී යාම හා වෘත්තියක දිගටම නියැලී නොසිටීම වැනි අඩුපාඩුකම් දක්නට ඇත.

ළමා අවශ්‍යතා ඉටුවීමට මං සැලසීම බාලාපචාරය වැළැක්වීම සම්බන්ධ -යෙන් වැදගත් කරුණකි. උචිත ගෙදර පරිසරය මෙන්ම සමාජ පරිසරයද මෙතින් ලැබෙන අනුකූලතාවය හා අනුබලය විසින් දරුවා යහපත් මගකට පිවිසවනු ඇතැයි බලාපොරොත්තු විය හැකිය. වැඩෙන දරුවාගේ සමබර මානසික වර්ධනයට රුකුලක් වන පරිදි ගෙදර පරිසරය නිර්මාණය වී තිබීම අවශ්‍යය. ආර්ථික වශයෙන් යුක්තිය ඉටුවන හා සංස්කෘතික හර පද්ධතීන්ගෙන් පෝෂණය වූ, තෘප්තිමත් ස්වභාවය උසුලන සමාජ පරිසරයක් ජන සමාජයේ විය යුතුය.

***************

UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA